# ස්පර්ශනීය සංස්කෘතික උරුමය අංකිත (Digital) ස්වරූපයෙන් වාර්තා කිරීමේ අවැසියාව හා එ සේ වාර්තා කිරීම සඳහා යෝග්‍ය අංකණ ක්‍රමයක් සහිත ආකෘතියක්

**අනුරාධ පියදාස[1], චන්දිම බණ්ඩාර අඹන්වල[2], මහින්ද කරුණාරත්න[3]**

[1]පුරතැගුම ව්‍යාපෘතිය, පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, කොළඹ. *anuradha@ieee.org*
[2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
[3] පර්යේෂණ නිලධාරී, මුහුදු පුරාවිද්‍යා ඒකකය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාල්ල

## හැඳින්වීම

මිනිස් අතීතය නිරූපණය කරන සංස්කෘතික උරුමය ස්පර්ශනීය හා අස්පර්ශනීය ලෙස වර්ග කරන අතර මෙහි දී 'ස්පර්ශනීය සංස්කෘතික උරුමය' හා එය අංකිත ස්වරූපයෙන් වාර්තා කිරීම සඳහා යෝග්‍ය අංකණ ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳ ව අවධානය යොමු කරනු ලැබේ.

## ස්පර්ශනීය සංස්කෘතික උරුමස්ථානයන්ගේ ස්වභාවය

මානවයාගේ චින්තනය, සිතුම්පැතුම්, වීරත්වය, ප්‍රබලත්වය, හා සංවේදීබව ප්‍රකාශ කරන භෞතික ව ස්පර්ශ කළ හැකි අවශේෂ, ස්පර්ශනීය සංස්කෘතික උරුමය ලෙස හඳුනා ගනී. මෙම සාධක අදින් වසර ලක්‍ෂය ඉක්මවා යන කාලයක සිට අදින් වසර 100කට එ පිට කාලය දක්වා පරාසයක් නියෝජනය කරයි. ස්පර්ශනීය සංස්කෘතික උරුමය ස්වභාව, නිර්මාණ තාක්‍ෂණය, උපයෝගිතාව, කර්තෘත්වය ආදී විවිධ කරුණු සම්බන්දයෙන් සංකීර්ණ වේ.

## සංස්කෘතික උරුමස්ථාන වාර්තාකරණයේ වැදැගත්කම

ස්පර්ශනීය සංස්කෘතික උරුම ස්ථානයකට ආවේනික වැදැගත් කමක් හිමි වීම ස්වාභාවික නමුත් වත්මන් ව්‍යවහාරය අනුව ඊට වටිනාකමක් ආරෝපණය වන්නේ එම සංස්කෘතික උරුමය වාර්තාකොට තිබෙන ආකාරය අනුව ය. නිසි උරුම වාර්තාකරණය මිගින් පහත දැක්වෙන වාසි උදා වේ.

- සංස්කෘතික උරුම ක්‍ෂේත්‍රයක පවත්නා ශක්‍යතාව තක්සේරු කළ හැකි වීම
- සංස්කෘතික උරුමය කෙරෙහි සිදු වන ස්වාභාවික හා ද්වේෂ සහගත හානිය තක්සේරු කිරීමට හැකි වීම
- ඉතිහාස රචනයේ දී සජීවි මූලාශ්‍රයක් වශයෙන් ආබද්ධ කර ගත හැකි වීම
- අතීත මිනිසාගේ චින්තනය හා පරිසරාත්මක සබැඳියාව නිරූපණය කරන සලකුණක් වශයෙන් අගය කළ හැකි වීම.
- මානව වර්ගයාගේ පොදු උරුමයක් වශයෙන් සමාජගත කළ හැකි වීම
- සංරක්‍ෂණ, සංචාරක ආදී උරුම කළමනාකරණ ක්‍රියාදාමයන්හි දී මඟ පෙන්වන්නෙක් ලෙස යොදාගත හැකි වීම
- මූල්‍ය උත්පාදක ප්‍රපංචයක් වශයෙන් උපයෝගි කරගත හැකි වීම
- අධ්‍යයන, පර්යේෂණ කාර්යයන් සඳහා අනුබලයක් වීම

## ලංකාවේ ස්පර්ශනීය සංස්කෘතික උරුමය වාර්තා කිරීමේ උත්සාහයන්

ලංකාවේ පැරණි ම ලේඛන තුළින් සංස්කෘතික උරුමය වාර්තාකරණයට යම් උත්සාහයක් ගෙන ඇති බව පෙනේ. ශිෂ්ටාචාරය ආරම්භක කාලයේ දී ද්‍රව්‍යාත්මක සංසිද්ධීන් උරුමය ලෙස හෝ උරුමය වාර්තාකරණය ලෙස සංකල්පගත කොට හිඳුනා නොගත්ත ද සිදුකර ඇති සමහර ක්‍රියාවන් උරුමය වාර්තා කිරීමට ගත් උත්සාහයක් ලෙස හඳුනාගත හැකි වේ.

'ක්ෂේත්‍ර හා ස්මාරක වාර්තාකරණ (Site and Monument Recording - SMR)' සංකල්ප යටතේ මෙ වැනි ස්පර්ශනීය සංස්කෘතික උරුමයන් වාර්තා වුවත් එය ජාතික වැඩපිළිවෙලක් වශයෙන් සිදුවන බවක් පෙනී යන්නේ නැත. මෙම තත්ත්වය අවබෝධ කොටගනිමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනත් ආයතන කීපයක් විසින් ම මෙ වැනි කාර්යයන් අරඹා ඇති බව පෙනේ.

### ස්පර්ශනීය සංස්කෘතික උරුමය වාර්තා කිරීමේ උත්සාහයන් වල පවත්නා දුර්වලතාවන්

ලංකාවේ සංස්කෘතික උරුම වාර්තාකරණයන් අවලෝකනයේ දී ඒවායේ සිද්ධාන්තමය හා ප්‍රායෝගික වශයෙන් දුර්වලතා පවතින බව හිඳුනාගත හැක. මෙවා ආවේනික හා ආවේනික නොවන දුර්වලතා යනුවෙන් වෙන් කළ හැකි වන අතර ඒ පිළිබිඳ නිදසුන් කීපයක් පහත දැක් වේ.

### ආවේනික ගැටලු

යම් පද්ධතියක පවත්නා ස්වභාවය හා ව්‍යුහය අනුව මගහරවා ගැනිමට අපහසු, අනිවාර්ය බාධක වශයෙන් ඉස්මතු වන තත්ත්ව ආවේනික ගැටලු වශයෙන් හිඳුනා ගත හැක.

- භූ භෞතික වශයෙන් දිවයින කුඩා වුවත් සංස්කෘතික උරුමය, එහි ව්‍යාප්තිය, ස්වභාවය යන අංශ අතින් අතිශය බහුල හා සංකීර්ණ වීම.
- සංස්කෘතික උරුම ක්ෂෙත්‍රයක් අයත් වන්නේ කුමන වර්ගයකට ද යන්න නිර්ණය කිරීම අපහසු වීම.
- සාමාන්‍ය ජනයා කෙරෙන් දිස්වන මන්දෝත්සාහී බව
- ගුරුකුල ගැටුම් හා අනෙකුත් අගතීන්

### ආවේනික නොවන දුර්වලතා

පද්ධතියේ පවත්නා ලක්ෂණවලට බාහිර වශයෙන් පැන නිගින්නා වූ ගැටලු මේ යටතේ හිඳුනාගත හැකි අතර උත්සාහය, කැපවීම, බුද්ධිමය මගපෙන්වීම හා කණ්ඩායම් ක්‍රියාකාරීත්වය තුළින් මෙ වැනි ගැටලු හෙවත් දුර්වලතාවන් අවම කරගත හැක.

- ස්පර්ශනීය සංස්කෘතික උරුමය වර්ගකිරීමේ නිසි පදනමක් නොමැති වීම
- පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයක් හිඳුනා ගැනීමේ පදනම අපහැදිළි වීම
- මහජන දැනුවත් කිරීම හා මහජනයාට මැදිහත්වීමට ඉඩකඩ නොසැලසීම
- විවිධ ආයතන හා එකම ආයතනයේ විවිධ පුද්ගලයන් විසින් සිදු කරන වාර්තා කිරීම් පුද්ගලානුබද්ධ කාර්යයක් පමණක් වීම
- බුද්ධිමය, තාක්ෂණික වර්ධනය හෝ අනාගත අවශ්‍යතා අනුව සිදුවිය යුතු ප්‍රසාරණයන් සිදහා අවැසි ඉඩකඩ නොමැති වීම
- උරුමය අනන්‍යගත කිරීමේදී එහි පැහැදිළි, ක්‍රමවත් ක්‍රමවේදයක් නොමැති වීම
- විටෙක පිරිවැය අධික ක්‍රමවේද භාවිත කිරීම

මෙම පද්ධතීන් අතර සහසම්බන්ධතාවක් නොමැති බැවින් අනවශ්‍ය ලෙස එක ම ක්ෂේත්‍රය නැවැතනැවැත වාර්තාකරණය සිදු වීමට ඉඩ ඇත. එ මෙන් ම පරිපූර්ණ වාර්තාකරණයක් නොවන බැවින් ඉදිරි ජාතික අවශ්‍යතාවන් සිදහා උක්ත දත්ත පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා අනවශය පිරිවැයක් දරමින් නැවැත වාර්තාකරණ කටයුතු සිදු කිරීමට සිදු වනු ඇත. එ මෙන් ම මහජනයා සිදහා හෝ ප්‍රතිපත්ති සම්පාදකයන් සිදහා තත් පද්ධති නිර්මාණය නොවීම නිසා මෙම දත්ත පද්ධති උපයෝගිතාවෙන් හීන කාර්යයක් පමණක් වනු ඇත.

### ගෝලීය වශයෙන් ස්පර්ශනීය සංස්කෘතික උරුමය වාර්තා කිරීමේ තත්ත්වය

ලොව විවිධ සංස්කෘති හා ශිෂ්ටාචාර නියෝජනය කරමින් පවත්නා සංස්කෘතික උරුමය වාර්තා කිරීම සිදහා විවිධ උත්සාහයන් ගෙන ඇත. එ වැනි සාර්ථක පද්ධතීන්හි ස්වභාවය නිරීක්ෂණය කිරීමේ දී හිඳුනාගත හැකි ලක්ෂණ කිපයකි.

- ඒකමිතික වාර්තාකරණය
- බහුවිධ වාර්තාකරණය
- විවෘතමූල පරිගණක මෘදුකාංග (Open Source) හා අඩු පිරිවැයක් සහිත පරිගණක මෘදුකාංග භාවිතය
- ඵලදායි ලෙස මහජන සහභාගීත්වය සඳහා ඉඩ සැලැසීම
- පාලනය මධ්‍යගත වීම හා දත්ත/ තොරතුරු (Data Input) හා ආදානය (Data/Information receiving) විමධ්‍යගත වීම
- ඵලදායි ආර්ථික කාර්යයක් වශයෙන් නිර්මාණය වීම.

මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කර, ගැටලු හා දුර්වලතා මඟහරවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතා හා වුවමනාවන් සැපිරීමට ප්‍රමාණවත් වන පහත ආකෘතිය අප විසින් යෝජනා කරනු ලැබේ.

**යෝජිත ආකෘතියේ ස්වභාවය**

ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා පාලනය මධ්‍යගත ඒකකයක් මඟින් හා දත්ත ආදානය හා ප්‍රතිදානය විමධ්‍යගත කරමින් අව ම පිරිවැයක් යටතේ මහජන සහභාගිත්වය උපරිම වන අයුරින් මෙම පද්ධතිය යෝජනා කෙරේ. බෙහෙවින් ජනප්‍රිය විශ්ව ව්‍යාප්ත ජාලය (Wirld Wide Web) ඔස්සේ වෙබ් අඩවියක් මඟින් මෙම පද්ධතිය ක්‍රියාත්මක වනු ඇත. එ මඟින්, **දවසේ පැය 24 පුරාම සේවාව සපයන, භෞතික සීමා මායිම් නොමැති, විශාල පිරිසකට එකවර භාවිත කළ හැකි, භාවිත කරන්නන්ට ඉතා පහසු** පද්ධතියක් බවට මෙම පද්ධතිය පත් කළ හැක.


යෝජිත මෙම ආකෘතිය ප්‍රධාන ඒකක/ කොටස් හතරකින් සමන්විත ය.

1 පාලන හා කළමනාකරණ ඒකකය
**Administration and Management Module**

2 දත්ත යෙදීමේ ඒකකය
**Data Entry Module**

3 පොදු පරිශීලන ඒකකය
**Public Interface Module**

4 දත්ත නිවැරදිතාව රැකීමේ ඒකකය
**Moderation Module**




1 රූපය: යෝජිත පද්ධතියේ ඒකක

**පාලන හා කළමනාකරණ ඒකකය**

යෝජිත ආකෘතිය නිර්මාණය, සැලසුම්කරණය, ක්ෂේත්‍ර වර්ගීකරණය මෙහෙය වීම ඇතුළු සියලු ම පාලන හා කළමනාකරණ කෘත්‍යයන් මෙම ඒකකය මඟින් සිදු කෙරේ. මෙ මඟින් අපේක්ෂිත කාර්යාවලිය ඉටු කිරීම මණ්ඩල දෙකක් යටතේ සිදු කරනු ඇත. එ නම්, **අ. විද්වත් මණ්ඩලය** හා **ආ. තාක්ෂණ මණ්ඩලය** යනුවෙනි. ස්පර්ශනීය සංස්කෘතික උරුම ක්ෂේත්‍ර වාර්තා කරන්නේ කෙ සේ ද? වර්ගීකරණ නිර්ණායක මොනවා ද? යන්න තීරණය කිරීම හා මිණුම්දඬු උපකාරයෙන් ක්ෂේත්‍රය කුමණ වර්ගයකට අයත් ද යන්න තීරණය කිරීම විද්වත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වනු ඇත. යෝජිත මෙම පද්ධතිය සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ අධිකාරි බලය ද මෙම ඒකකයට අයත් වන අතර විශේෂඥ පුරාවිද්‍යාඥයින් මණ්ඩලයකින් මෙම ඒකකය සමන්විත විය යුතු වේ.

අපේක්ෂිත අරමුණු සාධනය වන ආකාරයෙන් අංකිත තාක්ෂණය (Digital Technology) යොදාගත හැක්කේ කෙ සේ ද? එහි හැකියාවන් හා සීමාවන් මොනවා ද? යන්න පිළිබඳ ව යෝජනා ඉදිරිපත් කර ඒවා ක්‍රියාවට නැංවීම තාක්ෂණික මණ්ඩලයේ කාර්යය වන අතර පද්ධතිය සඳහා අවැසි මෘදුකාංග සහාය (Software Diveloping) මෙම ඒකකය මඟින් සපුරාලනු ඇත.

### දත්ත යෙදවුම් ඒකකය

පද්ධතිය සිදහා දත්ත යෙදීම පාලන ඒකකයේ අනුමැතිය සහිත පිරිසක් විසින් හා පාලන ඒකකය මිගින් නිර්ණය කරන අවම අවශ්‍යතා සපුරණ මහජන පිරිස් විසින් කෙරෙනු ඇත. විශ්ව ව්‍යාප්ත ජාල පදනම් කරගත් පද්ධතියක් වන මේ සිදහා පාලන ඒකකයේ අනුමැතිය සහිත ව ක්ෂේත්‍ර පිළිබිඳ විස්තර, ඡායාරූප, ආකෘති ඉදිරිපත් කිරීමට මහජනයාට ඉඩ සැලැසීම මිගින් මෙම දත්ත පද්ධතිය සිදහා මහජන සහභාගීත්වය හා දැනුවත් කිරීම ලබා ගැනීම අපේක්ෂා කරනු ඇත.

### පොදු පරිශීලන ඒකකය

විශ්වව්‍යාප්ත ජාලය ඔස්සේ ක්‍රියාත්මක මෙම පද්ධතියේ පරිශීලනය කිරීමට ගෝලීය මට්ටමින් ඉඩ සලසනු ලැබේ. ඉලක්කගත කණ්ඩායම් වෙත තොරතුරු සැපයීමේ දී ඒවායේ සීමා නිර්ණය කිරීම හා පරිශීලකයන් වර්ග කිරීම (Catagorization) ආදිය ද පාලන ඒකකය මිගින් ම සිදු කරනු ඇත.

### දත්ත නිවැරදිතාව රැකීමේ ඒකකය


පද්ධතියට ඇතුළු කරන දත්ත වල නිවැරදිතාව විශේෂඥයන්ගේ සහයෝගය මගින් තහවුරු කර ගැනීම සිදු කරනු ඇත.

### අනන්‍ය අංකණය (Unique Numbering System)

යෝජිත පද්ධතියේ දී එක් එක් සංස්කෘතික උරුමය සිදහා අනන්‍ය අංකණයක් හිමිවන අතර එම ක්ෂේත්‍රය හා සම්බන්ධ සෑම කාර්යක දී මෙම අංකණය භාවිත කිරීමට යෝජනා කරනු ලැබේ. ශ්‍රී ලංකා ජනරජයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් අංකගත කිරිමට අනුයාත අයුරින් මෙම අංකනය ක්‍රියාත්මක වේ. මෙය පහත උදාහරණයෙන් පැහැදිලි කෙරේ.

පළාත් අංකය - දිස්ත්‍රික් අංකය - ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ අංකය - ග්‍රාම නිලධාරී වසම් අංකය - ග්‍රාමනිලධාරී වසම තුල ස්පර්ශනීය සංස්කෘතික උරුම ක්ෂේත්‍රයේ අනුක්‍රමික අංකය - එම ක්ෂේත්‍රය තුළ ස්පර්ශනීය සංස්කෘතික උරුමයේ අනුක්‍රමික අංකය

උදාහරණයෘ දකුණු පළාතේ මාතර දිස්ත්‍රිකයේ දෙවිනුවර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ තලල්ල ග්‍රාමනිලධාරි වසමේ පිහිටා ඇති නාඹටුන්න අම්බලම මෙම පද්ධතියට දත්ත ඇතුළු කිරිමේ අප හට එම ග්‍රාමනිලධාරි වසමේදි හමු වූ 15වන ස්පර්ශනීය සංස්කෘතික උරුම ක්ෂේත්‍රය නම් හා එම ක්ෂේත්‍රය තුළ දෙ වැනි සංස්කෘතික උරුමය නම්, එයට හිමි අනන්‍ය අංකය වනුයේඃ




2 රූපය : යෝජිත අනන්‍ය අංකණය

මෙම ක්‍රමවේදය අනුව දිවයිනේ ඕනෑ ම ස්පර්ශනීය සංස්කෘතික උරුමස්ථානයක් නිරවුල් අන්දමින් අන්දමින් වාර්තා කිරීමට හැකියාව ඇත.

### ඉදිරි ව්‍යාප්ති අවස්ථා

ඉදිරියේ දී සිදු වන ප්‍රසාරණයන් සමිග අනුගත විය හැකි පරිදි හා ස්පර්ශනීය සංස්කෘතික උරුමස්ථාන නොවන ක්ෂේත්‍රයන් වෙත ද ව්‍යාප්ත කිරිමේ හැකියාව සහිත ව මෙය ක්‍රියාත්මක වේ. ඒ අනුව ඉදිරියේ දී ක්‍රියාත්මක කළ හැකි,

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය වාර්තා කිරීම
- ස්වාභාවික උරුමය වාර්තා කිරීම
- පුරාවිද්‍යාත්මක කැනීම් හා ගවේෂණ එ සැනින් වාර්තා කොට මධ්‍යගත පද්ධතියකට දත්ත ප්‍රේෂණය කිරීම
- අදාළ ජාතික ආයතන පද්ධතිය සමිග ඒකාබද්ධ කළ හැකි වීම

- සංචාරක දැනුවත් කිරීම හා සංචාරක ව්‍යාපාරයෙහි ලා උපකෘත යටිතල පහසුකම් පිළිබඳ දැනුවත් කළ හැකි වීම
- ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ අවශ්‍යතා සිදහා දොරටු විවර කිරීම.
- සංස්කෘතික උරුම වාර්තාකරණය සිදහා ව්‍යාපාරික ප්‍රජාව සහභාගි කර ගැනීම,

යන කාරණා කෙරෙහි පහසුවෙන් ව්‍යාප්ත කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

## සමාලෝචනය

සංස්කෘතික උරුම වාර්තාකරණය ජාත්‍යන්තර වශයෙන් ඉහළ තලයකට වර්ධනය වී ඇති අතර ම ඒ හා දෙ වැනි නොවන අයුරේ තර්ජනයකට ද ලක් වී ඇත. එ බැවින් නිසි ක්‍රියාදාමයකින් යුත්ත ස්පර්ශනීය සංස්කෘතික උරුමය වාර්තා කිරීම කඩිනම් ජාතික අවශ්‍යතාවක් බවට පත් වී ඇත.

## ආශ්‍රෙය ග්‍රන්ථ

පියදාස, ඒ., සි.බී. අඹන්වල හා එම්. කරුණාරත්න, (2009) ශ්‍රී ලංකාවේ ස්පර්ශනය සංස්කෘතික උරුමය අංකිත ස්වරූපයෙන් වාර්තා කිරීමේ අවශ්‍යතාව හා එ සේ වාර්තා කිරීම සිදහා යෝජිත ආකෘතියක්, ජාතික පුරාවිද්‍යා සමුළුව 2009, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ. 115-124

Deraniyagala, S., (1992) The Prehistory of Sri Lanka : An Ecological Perspective, Department of Archaeological Survey, Sri Lanka.